DOI : 10.31357/fhssmst.2008.00684

# ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

## (2001 පාර්ලිමේන්තු මහ මැතිවරණය ඇසුරින්)

06 JUN 2008

හේවා යද්දෙහිගේ සුනිල් ගුණසේකර

ලියාපදිංචි අංකය : GS/SS/1575/2002

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

අපරාධවිද්‍යාව විෂයය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.



2008.06.03
දිනය

එච්.වයි.එස්. ගුණසේකර

## උපදේශකවරයාගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

2008. 6. 3

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර

අධ්‍යයනාංශ ප්‍රධාන

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

නුගේගොඩ.

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
06 JUN 2008
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පටුන | I-II |
| සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන් | III-IV |
| ස්තුතිය | V-VI |
| **පළමුවැනි පරිච්ඡේදය** | |
| **හැඳින්වීම සහ ක්‍රමවේදය** | **1-24** |
| 1.1 හැඳින්වීම | 1-13 |
| 1.2 පර්යේෂණ ගැටළුව | 13-14 |
| 1.3 අධ්‍යයනයේ අරමුණු | 15 |
| 1.4 මූලාශ්‍ර භාවිතය සහ දත්ත රැස්කිරීම | 15-20 |
| 1.4.1 මූලාශ්‍ර විග්‍රහ කිරීම | 15-16 |
| 1.4.2 නියැදිකරණය සහ දත්ත රැස්කිරීම | 17-20 |
| 1.5 අධ්‍යයනයේ සීමා සහ ගැටළු | 20-22 |
| 1.5.1 සංකල්පමය සීමාවන් | 20 |
| 1.5.2 ක්ෂේත්‍ර සීමා | 21 |
| 1.5.3 ගැටළු | 21-22 |
| 1.6 පරිච්ඡේදකරණය | 22-24 |
| **දෙවැනි පරිච්ඡේදය** | |
| **ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සංකල්පීය සහ න්‍යායාත්මක විග්‍රහය** | **25-50** |
| 2.1 හැඳින්වීම | 25 |
| 2.2 ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අර්ථ නිරූපණ | 25-34 |
| 2.3 ප්‍රචණ්ඩත්වයේ විවිධ ස්වරූප සහ මැතිවරණ ප්‍රචණ්ඩත්වය | 35-42 |
| 2.4 මැතිවරණ ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපානු ලබන සාධක අපරාධ විද්‍යාත්මක න්‍යායන් ඇසුරින් පැහැදිලි කිරීම | 42-50 |

තෙවැනි පරිච්ඡේදය

**ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය සහ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා** **51-76**

3.1 හැදින්වීම 51-53

3.2 ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය 53-60

3.3 ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන් හි ආරම්භය සහ විකාශනය 60-70

3.4 ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන් හි කාලීන ප්‍රවණතා 70-72

3.5 ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණය 72-76

සිව්වැනි පරිච්ඡේදය

**ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත කාලීන ප්‍රවණතා** **77-112**

4.1 අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම 77-81

4.2 පුත්තලම මැතිවරණ දිස්ත්‍රික්කයේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන්හි ස්වරූපය 81-95

4.3 මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීමට තුඩු දෙනු ලැබූ සාධක සහ එහි පවතින සුවිශේෂ ලක්ෂණ සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් දක්වූ අදහස් 96-101

4.4 මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන්ට ගොදුරු වූවන් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් හෙළි කරනු ලැබූ කරුණු 101-105

4.5 මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන් හි නිරත වූවන්ගේ පසුබිම සහ ඔවුන් ප්‍රචණ්ඩ ක්‍රියාවලට පොළඹවන ලද සාධක 105-108

4.6 මැතිවරණ ප්‍රචණ්ඩත්වයට බලපානු ලබන්නාවූ සාධක සම්බන්ධයෙන් ආගමික නායකයින්, ප්‍රභූවරුන්, දේශපාලනඥයින් සහ මැතිවරණ නිරීක්ෂකයින් දරන මතය 108-112

පස්වැනි පරිච්ඡේදය

**නිගමන සහ නිර්දේශ** **113-119**

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 120-126

උපග්‍රන්ථය i-vi

# සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන්

සංඛ්‍යා වගු | පිටු අංකය


| | | |
|---|---|---|
| වගු අංක 1.1 - | 1977 සිට 2002 දක්වා ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් ප්‍රමාණය | 9 |
| වගු අංක 1.2 - | මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 1999 සිට 2003 | 9 |
| වගු අංකය 1.3 - | දේශපාලනඥයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් කරනු ලැබූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා. | 10 |
| වගු අංක 1.4 - | අත්අඩංගුවට ගනු ලැබූ පාර්ලිමේන්තු/පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු 2000 සිට 2003. | 11 |
| වගු අංක 1.5 - | වාර්තාගත ප්‍රචණ්ඩ ක්‍රියා - 2001 මහා මැතිවරණය | 18 |
| වගු අංක 3.1 - | මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 1970-1997 | 67 |
| වගු අංක 3.2 - | මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා 1999 සිට 2001 | 69 |
| වගු අංක 4.1 - | විවිධ මැතිවරණයන්හිදී වාර්තා වූ ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යා | 78 |
| වගු අංක 4.2 - | 2001 වර්ෂයේදී පුත්තලම මැතිවරණ දිස්ත්‍රික්කය තුළ සිදු වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා | 83 |
| වගු අංක 4.3 - | දණ්ඩ නීති සංග්‍රහය අපරාධ හඳුන්වා දී ඇති ආකාරය. | 84 |
| වගු අංක 4.4 - | මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි භූගෝලීය ව්‍යාප්තිය - 2001 පාර්ලිමේන්තු මහා මැතිවරණය | 85 |
| වගු අංක 4.5 - | මැතිවරණ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් අයත් වයස් කාණ්ඩ | 88 |
| වගු අංක 4.6 - | මැතිවරණ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්ගේ අධ්‍යාපන මට්ටම | 89 |
| වගු අංක 4.7 - | මැතිවරණ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ගේ සේවානියුක්තිය | 90 |

වගු අංක 4.8 - මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි නිරතවූවන්ගේ වයස් කාණ්ඩ 92

වගුව අංක 4.9 - මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි නිරත වූවන්ගේ අධ්‍යාපන මට්ටම 94

වගු අංක 4.10 - මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි නිරතවූවන්ගේ සේවානියුක්තිය 95

වගු අංක 4.11 - ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය 2001 පාර්ලිමේන්තු මැතිවරණය 106

ප්‍රස්තාර සටහන් පිටු අංකය

ප්‍රස්තාර අංක 4.1 - මැතිවරණ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්ගේ ජාතිකත්වය සහ ආගමික පසුබිම 87

ප්‍රස්තාර අංක 4.2 - මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියාවන්හි නිරතවූවන්ගේ ජාතිකත්වය සහ ආගමික පසුබිම 91

# ස්තුතිය

ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මැතිවරණයන් ආශ්‍රිතව හටගනු ලැබූ මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීම කාලෝචිත සහ වැදගත් ශාස්ත්‍රීය කටයුත්තක් බව අවබෝධ කරවමින් සහ එම පර්යේෂණ කාර්ය පිළිබඳව මාර්ගෝපදේශකත්වය ලබාදෙමින් පරිශීලනය කළයුතු පොතපත පිළිබඳව නිරන්තරයෙන් උපදෙස් ලබාදුන් මෙම පර්යේෂණ නිබන්ධයේ උපදේශිකා ආචාර්ය එම්.සී. ස්වර්ණලතා පෙරේරා මහත්මියට ප්‍රථමයෙන්ම මාගේ හෘදයාංගම ස්තුතිය පිරි නමමි. මෙම පර්යේෂණ කෘතියේ කටයුතු කරමින් සිටින විට උපදේශකතුමිය විදේශගතවීම නිසා මට මුහුණපෑමට සිදුවූ ගැටළුවලට උපදෙස් ලබාදෙමින් ඉතිරි කටයුතු නිම කිරීමට මහෝපකාරී වූ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානී ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාටත් එමෙන්ම මෙම පර්යේෂණය ආරම්භයේ සිට අවසානය දක්වා සෙවනැල්ලක් මෙන් සිට දැනුම හා දිරිය මට ලබාදුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ. ආර් .පී. උදය කුමාර මහතාටත් ගෞරව පූර්වක ස්තුතිය පළ කරමි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්ලිව්. එම්. ධනපාල මහතා, කථිකාචාරිණී නිරන්ජි රූපා මල්කාන්ති මෙනෙවිය සහ අනුෂා එදිරිසිංහ මහත්මිය මෙහිදී දක්වූ කාරුණික සහාය මෙම පර්යේෂණ නිබන්ධය වඩාත් සාර්ථක කර ගැනීමට හේතු වූ බව කාරුණිකව සිහිපත් කරනු කැමැත්තෙමි.

සිය වටිනා කාලයෙන් මදක් මා වෙනුවෙන් කැපකර මැතිවරණ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මා සමඟ සාකච්ඡාවක නිරතවීම සහ අවශ්‍ය නිල තොරතුරු ලබාදීමට දෙපාර්තමේන්තු නිලධාරීන්ට උපදෙස් දීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතාටත්, මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත සපයන මෙන් වයඹ පළාතේ සියලු ම පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන්ට උපදෙස් දීම සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බෝධි ලියනගේ (පරිපාලන) මහතාටත්, පසුගිය මැතිවරණ හා ප්‍රණ්ඩත්වයට අදාළ දත්ත ලබාදීම සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ නියෝජ්‍ය පොලිස්පති බී.කේ. ගාමිණී නවරත්න (තොරතුරු තාක්ෂණ දිසාව සහ මැතිවරණ) මහතාටත්, මැතිවරණ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සංඛ්‍යා ලේඛන හා මත විමසීම්වලට සහභාගි වී සහාය දක්වීම සම්බන්ධයෙන් හලාවත පොලිස් අධිකාරී කොට්ඨාසයට අයත් සියලු ම පොලිස් ස්ථානයන් හි ස්ථානාධිපතිවරුන්ට සහ

නිලධාරීන්ටත් විශේෂයෙන් හලාවත පොලිස් අධිකාරී කාර්යාලයේ කාන්තා පොලිස් සැරයන් ජයන්ති ලින්දර මහත්මියටත්, මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය සියලු ම ආඥා පනත් ලබාදුන් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ, අධිකාරී ඕ. ආර්. ජැක්සන් මහතාටත්, දශක පහකට වඩා ඉපැරණි පුවත්පත් සූක්ෂම ඡායාපටල (Micro Films) භාවිතයෙන් කියවීමට සහ විෂයයට අදාල අනුක්‍රමණිකගත කරන ලද පුවත්පත් ලිපි (Indexed News Paper Article) භාවිතා කිරීමට සහ ලේක්හවුස් පුස්තකාලය අවහිරයකින් තොරව යොදා ගැනීමට සහාය ලබාදුන් පුස්තකාලයාධිපති එස්.කේ. සිරිසේන මහතාටත් මගේ විශේෂ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

එමෙන්ම තමන් ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ සියලුම මැතිවරණ නිරීක්ෂණ වාර්තාවන් නොමිලයේ මා වෙත ලබාදීම සම්බන්ධයෙන් දේශීය මැතිවරණ නිරීක්ෂණ ආයතනයන් වන නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ව්‍යාපාරයට (පැෆරල්) සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට ද (මැ.ප්‍ර.නි.ම.) ස්තුතිය පළ කරන අතර කෙටි කාලයක් ඇතුළත මෙම පර්යේෂණ නිබන්ධය පරිගණකගත කර දුන් නුගේගොඩ, ගංගොඩවිල, ශ්‍රී සෝරත මාවතේ, සැණික්ටා කොමියුනිකේෂන් ආයතනයට ද මාගේ ස්තුතිය හිමි විය යුතුය.

ක්ෂේත්‍ර අධ්‍යයනයේ නිරත වූ කාලය තුළ දී දත්ත සපයා ගැනීමට පමණක් නොව ආහාරපාන පවා නොමසුරුව ලබා දෙමින් සහෝදරත්වයෙන් කටයුතුකළ මාදම්පේ, එගොඩවත්තේ, "ටෙරන්ස්" හි කේ. එම්. ටී. එම්. තමෙල් මහතාට සහ එම මහත්මියට හෘදයාංගම ස්තුතිය පළ කරමි. කවදත් මාගේ අධ්‍යයන කටයුතුවලට සිය පහසුකම් මා වෙනුවෙන් කැපකර මට සහාය දක්වන හෙක්ටර් අයියාට සහ ජය අක්කාට ද කෘතවේදීත්වය පළ කරන අතර පත්මාගෙන් ලද සහාය ද සෙනෙහසින් සිහිපත් කරමි.

එච්.වයි.එස්. ගුණසේකර

# පළමුවැනි පරිච්ඡේදය

# හැඳින්වීම සහ ක්‍රමවේදය

1.1 හැඳින්වීම

1.2 පර්යේෂණ ගැටළුව

1.3 අධ්‍යයනයේ අරමුණු

1.4 මූලාශ්‍ර භාවිතය සහ දත්ත රැස්කිරීම

1.4.1 මූලාශ්‍ර විග්‍රහ කිරීම

1.4.2 නියැදිකරණය සහ දත්ත රැස්කිරීම

1.5 අධ්‍යයනයේ සීමා සහ ගැටළු

1.5.1 සංකල්පමය සීමාවන්

1.5.2 ක්ෂේත්‍ර සීමා

1.5.3 ගැටළු

1.6 පරිච්ඡේදකරණය

## 1.1 හැඳින්වීම

අපරාධවිද්‍යා විෂයයේ දී ප්‍රචණ්ඩත්වය යන සංකල්පය නිරන්තරයෙන්ම සාකච්ඡාවට භාජනය වී ඇති, එමෙන්ම ඉතා පුළුල් හා අතිශයින් සංකීර්ණ වූවකි. විවිධ සමාජ විද්‍යාඥයින්, අපරාධ විද්‍යාඥයින් හා පර්යේෂකයින් ප්‍රචණ්ඩත්වය (Violence) නොයෙක් ආකාරයෙන් විග්‍රහකර ඇති අතර වර්ගීකරණයන් රාශියක් ද ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇත. ආචාර්ය එස්.එස්. ශ්‍රීවාස්තවා (Dr. S. S. Srivastava) ප්‍රචණ්ඩත්වය විග්‍රහ කරමින් ප්‍රකාශ කර ඇත්තේ,

"එක් පුද්ගලයෙක් හෝ පුද්ගලයින් කීප දෙනෙක් තවත් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින් කීපදෙනෙකුට එරෙහිව යොදන ශාරීරික බලයයි. (ශ්‍රීවාස්තවා, 2002: 286)" එසේ බලය යෙදීමෙන් කරනු ලබන ක්‍රියාවන් ශාරීරිකව හෝ දේපලවලට හෝ තිසැකයෙන්ම හානියක් පමුණුවන බව ඔහු පෙන්වා දේ. එමෙන්ම මානසිකව සලකා බලන විට ආත්ම ගෞරවයට හානි පමුණුවනු ලබන්නාවූ සියලු ක්‍රියාවන් ද ප්‍රචණ්ඩත්වය තුළට ගැබ් කළ හැකි බව ආචාර්ය ශ්‍රීවාස්තවා වැඩිදුරටත් පෙන්වා දේ. මේ අනුව සලකා බලන විට සාමාන්‍යයෙන් ප්‍රචණ්ඩත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ පුද්ගලයා මූලික කර ගනිමින් පැනනගින චර්යා රටාවක් වන අතර එය සෑම සමාජයකම පාහේ අපරාධ නීතිය මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ මානව හැසිරීමේ රටාවක් වේ.

ප්‍රචණ්ඩත්වයේ ආරම්භය සම්බන්ධයෙන් සලකා බලන විට ප්‍රචණ්ඩත්වය මානව සමාජයේ ආරම්භය දක්වාම ව්‍යාප්ත වන බව පෙනීයයි. දඩයම් යුගයේ ජීවත්වූ වනචාරී මිනිසුන්ගේ ක්‍රියාකාරකම් මීට සාක්ෂි සපයනු ලබයි. දෛනික ජීවිතයේ සිය අවශ්‍යතාවයන් සංතෘප්තකර ගැනීම සඳහා මොවුන්ට ප්‍රචණ්ඩත්වය නිරන්තරයෙන්ම භාවිත කිරීමට සිදුවිය. ගෝත්‍රික මානවයා තම ගෝත්‍රිකයින් සමඟ මෙන්ම සිය ගෝත්‍රයෙන් පිට කණ්ඩායම් සමඟ ද බොහෝවිට හැසිරී ඇත්තේ ප්‍රචණ්ඩ ආකාරයෙනි. සාමකාමී සහජීවනය ඔවුන්ට අකැපවිය. ආහාර සපයා ගැනීම සහ බොහෝ විට ආරක්ෂාව පතා ඔවුන් සිදුකළ ප්‍රචණ්ඩ ක්‍රියා මානව ඉතිහාසය පුරා සාධාරණීකරණයට ලක්වී ඇතිබව පෙනීයයි.

ඓතිහාසිකව සලකා බැලීමේදී රෝම ඉතිහාසය තුළින් ද ප්‍රචණ්ඩත්වය හා බැඳුණු සිදුවීම් මතුකර ගැනීම අපහසු නොවේ. ඒ අනුව රෝම ඉතිහාසය පුරා විවිධ ගණයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකළ දාමරිකයින් සම්බන්ධ ප්‍රවෘත්තීන් විවිධ මූලාශ්‍රවල සඳහන් වී තිබේ. එමෙන්ම බුදුරජාණන් වහන්සේගේ කාලයේ පවා දේවදත්ත, අංගුලිමාල, ආලවක වැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි නිරත වූ චරිත දක්නට ලැබේ. අශෝක අධිරාජ්‍යයාගේ ක්‍රියා කලාපයන් හේතු කර ගෙන ඔහු චණ්ඩාශෝක බවට පරිවර්තනය වීම ද මෙහි ලා අවධානයට ගත යුතුව ඇත.

පවුල සහ ගෝත්‍රය තුළ ඇතිවූ ප්‍රචණ්ඩත්වය පසුකාලීනව මහා සංග්‍රාම කරා වර්ධනය වූ ආකාරය මානව ඉතිහාසය පුරා හටගත් බිහිසුණු යුද්ධවලින් පැහැදිලි වේ. එම නිසා ප්‍රචණ්ඩත්වය විවිධ අන්දමින් වර්ගීකරණය කර, ගැඹුරින් අධ්‍යයනය කිරීමට විවිධ විද්වතුන් පෙළඹී ඇති ආකාරයක් පෙනී යයි. මේ අතර ආචාර්ය එස්.එස්. ශ්‍රීවාස්තවා ප්‍රචණ්ඩත්වය වර්ගීකරණය කර ඇති ආකාරය ද වැදගත් වේ. ශ්‍රීවාස්තවාගේ වර්ගීකරණය මෙසේය.

"ප්‍රචණ්ඩත්වය වර්ගීකරණය **(Classification of Violence)**

01. ගෘහස්ත ප්‍රචණ්ඩත්වය (Domestic Violence)
02. ළමා ප්‍රචණ්ඩත්වය (Child Violence)
03. ලිංගික ප්‍රචණ්ඩත්වය (Sex Violenජැ)
04. ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය (Ethnic Violence)
05. ජාතිවාදී ප්‍රචණ්ඩත්වය (Communal Violence)
06. බල අරගල ප්‍රචණ්ඩත්වය (Power Struggle Violence)
07. පංති ප්‍රචණ්ඩත්වය (Class Violence)
08. ආගම් ලබ්ධිකයින් විසින් කරනු ලබන්නාවූ ප්‍රචණ්ඩත්වය (Cult Violence)
09. ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය (Terrorist Violence)

10. ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය (Student Violence)

11. ප්‍රතිකාර්මික ප්‍රචණ්ඩත්වය (Remedial Violence)

12. තහංචි කඩ කිරීමේ ප්‍රචණ්ඩත්වය (Taboo Violence)

13. මැතිවරණ ප්‍රචණ්ඩත්වය (Election Violence)

14. වෘත්තීමය ප්‍රචණ්ඩත්වය (Professional Violence)

(Srivastava, 2002: 286)"

මෙකී ප්‍රචණ්ඩත්වය පිළිබඳ සියලු වර්ගීකරණයන් අතුරින් මැතිවරණයන් මූලික අරමුණ කර ගනිමින් කරනු ලබන්නාවූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පර්යේෂණය කිරීම මෙම අධ්‍යයනයේ පරමාර්ථයයි. එබැවින් මැතිවරණ ප්‍රචණ්ඩත්වය යනුවෙන් හැඳින්වෙනුයේ කුමන ස්වරූපයේ මානව රටා සමුදායක් ද යන්න සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම අතිශයින් වැදගත් වේ. මෙහිදී ප්‍රචණ්ඩත්වය හා සබැඳි "මැතිවරණ" යන්න කෙරෙහි ප්‍රථමයෙන්ම අප ගේ අවධානය යොමුවිය යුතුය.

වත්මන් ලෝකයේ රාජ්‍ය පාලනය උදෙසා රාජාණ්ඩු සහ ඒකාධිපති පාලන ක්‍රම ස්වල්පයක් පැවතියත් බෙහෙවින් ඒ සඳහා යොදාගෙන ඇත්තේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලන මූලධර්මයන් ය. මින් අදහස් කරනු ලබන්නේ මහජනතාව සෘජුව ම රාජ්‍ය පාලන කටයුතුවලට මැදිහත් නොවී ස්වකැමැත්ත මත තෝරාපත් කරනු ලබන්නාවූ තම නියෝජිතයින් මාර්ගයෙන් වක්‍රව රාජ්‍ය පාලනය ගෙන යාමයි.

නියෝජිතයින් මගින් පාලනය ගෙනයාමේ ප්‍රධානතම මූලධර්මය වනුයේ නිදහස් සහ සාධාරණ මැතිවරණ ක්‍රමයක් අනුගමනය කිරීම තුළින් පාලනය උදෙසා මහජන නියෝජිතයින් තෝරාපත්කර ගැනීමේ ක්‍රියාවලියයි. නියම කරගනු ලැබූ කාලය තුළ විටින් විට මැතිවරණ පවත්වමින් මහජන නියෝජිතයින් තෝරාපත්කර ගැනීම මෙහි විශේෂ ලක්ෂණයකි. මෙම ලක්ෂණය නිසා මැතිවරණ ක්‍රියාදාමය අන් සියලු ප්‍රජාතන්ත්‍රවාදී අංග අභිබවා ප්‍රමුඛස්ථානය හිමිකර ගෙන ඇත. විප්ලව, කැරලි හෝ කුමන්ත්‍රණ මගින් සමහර

විට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයන් පවා බිඳ හෙලමින් බලය ලබාගන්නාවූ ආඥාදායකයින් සහ ඒකාධිපති පාලකයින් පවා නාමිකව හෝ මැතිවරණ පවත්වන සම්ප්‍රදායක් ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබෙනුයේ මැතිවරණ ක්‍රමයේ පවතින මෙකී සුවිශේෂී ලක්ෂණය නිසා බව පෙන්වා දිය හැකිය. උදාහරණ වශයෙන් පකිස්ථානයේ අගමැති නවාෂ් ෂෙරීෆ් ගේ රජය පෙරලමින් බලය ලබාගන්නා ලද හමුදා නායක පර්වේස් මුෂාරෆ් පවා සිය බලය සුජාතකරණය කිරීම පිණිස මැතිවරණ පවත්වා තිබේ.

මේ අන්දමට මැතිවරණ පැවැත්වීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ පාර්ශවයන් අන්‍යොන්‍ය ජයග්‍රහණය උදෙසා කරනු ලබන කටයුතුවලදී ප්‍රචණ්ඩත්වය භාවිතයට ගෙන ඒ තුළින් උද්ගත වන්නා වූ සාපරාධී ක්‍රියාවන් හැදින්වීම පිණිස මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා යන භාෂිතය මෙහිදී භාවිත කරනු ලැබේ. ආචාර්ය එස්.එස්. ශ්‍රිවාස්තව, මෙම තත්වය විග්‍රහ කරමින් මැතිවරණ ප්‍රචණ්ඩත්වය අර්ථ දක්වා ඇත්තේ මෙසේය. "පාර්ලිමේන්තු, ප්‍රාන්ත සහ පළාත් පාලන ආයතනයන්හි මැතිවරණ සමයේ දී තරගකාරී පාර්ශවයන් අතර එකිනෙකාට එරෙහිව ඇතිවන්නාවූ විවිධ ගැටුම්කාරී තත්වයන්ය. (ශ්‍රිවාස්තවා. 2002: 2004)"

ශ්‍රිවාස්තවා පෙන්වා දෙනු ලබන මෙම තත්වය විවිධ පර්යේෂකයින් විසින් ජාත්‍යන්තර දේශපාලනය තුළ පවතින්නාවූ එක් ප්‍රවණතාවයක් ලෙස හඳුන්වා දී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද (United Nations) මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සහ ඡන්ද විමසීම් පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (International Institute for Democracy and Electoral Assistance-IDEA) හා සමඟ එක්ව ක්‍රියාකරමින් මැතිවරණ ප්‍රචණ්ඩත්වය ජාත්‍යන්තරව මර්දනය කිරීමට එක්සත්ජාතීන්ගේ සංවිධානය ද කටයුතු කරනු ලබන ආකාරයක් පෙනී යයි.

ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මැතිවරණයන් ආශ්‍රිතව හටගනු ලැබූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා විග්‍රහකර බැලීමේදී මෙම ප්‍රවණතාවය ශ්‍රී ලංකා මැතිවරණ ක්‍රියාවලිය තුලට ද ප්‍රවිෂ්ටව, ස්ථාපිත ස්වරූපයෙන් පවත්නා බව පෙනී යයි. මේ සම්බන්ධයෙන් වැඩිදුර

විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මැතිවරණයන් ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අපගේ අවධානය යොමුවිය යුතුය. එහිදී ශ්‍රී ලංකාවේ මැතිවරණයන් පැවැත්වූ කාලවකවානු අතිශයින් වැදගත් වෙනු ඇත. පහත දක්වෙනුයේ 1947 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මැතිවරණය සම්බන්ධ දත්තයන්ය.

**ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ මැතිවරණයන් 1947 සිට 2005 දක්වා.**

| | | |
|---|---|---|
| 1947 අගොස්තු | - | 23, 25, 26, 27, 28, 30 සහ සැප්තැම්බර් 01, 04, 06, 08, 09, 10, 11, 13, 15, 16, 17, 18 සහ 20 පළමුවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය. |
| 1952 මැයි | - | 24, 26, 28 සහ 30 දෙවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය. |
| 1956 අප්‍රේල් | - | 05, 07, 10 තෙවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය. |
| 1960 මාර්තු 19 | - | සිව්වැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය |
| 1960 ජුලි 20 | - | පස්වැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය |
| 1965 මාර්තු 22 | - | හයවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය |
| 1970 මැයි 27 | - | හත්වැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය (පළමුවන ජාතික රාජ්‍ය සභා මැතිවරණය) |
| 1977 ජුලි 21 | - | අටවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය |
| 1981 | - | දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය. |
| 1981 ජුනි 10 | - | යාපන දිස්ත්‍රික් සංවර්ධන මහා මැතිවරණය |
| 1982 ඔක්තෝබර් 21 | - | ප්‍රථම ජනාධිපතිවරණය. |
| 1982 දෙසැම්බර් 22 | - | ප්‍රථම ජනමත විචාරණය |
| 1983 මැයි 18 | - | පළාත් පාලන ආයතන 18 ක මැතිවරණය. |
| 1988 ජුනි 02 | - | ප්‍රථම පළාත් සභා ඡන්ද විමසීම. |
| 1988 දෙසැම්බර් 19 | - | දෙවැනි ජනාධිපතිවරණය. |
| 1989 පෙබරවාරි 15 | - | නවවැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය. |
| 1991 | - | දකුණු පළාත් සභා මැතිවරණය. |
| 1991 මැයි 11 | - | පළාත් පාලන ආයතන 308 ක් සඳහා මැතිවරණය. |